මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව
மத்திய மாகாண சபையின் அரச சேவைகள் ஆணைக்குழு
Public Service Commission of Central Provincial Council

අංක 244, කටුගස්තොට පාර, මහනුවර
இல. 244, கடுகஸ்தொட்டை வீதி, கண்டி
No. 244, Katugasthota Road, Kandy.

web site: www.psc.cp.gov.lk
e-mail: psc.cp.gov@gmail.com

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| කාර්යාලය<br>காரியாலயம்<br>Office | 081-2213097 | ලේකම්<br>செயலாளர்<br>Secretary | 081-2213096 | සහකාර ලේකම්<br>உதவி செயலாளர்<br>Asst. Secretary | 081-2213097 | ෆැක්ස්<br>பெக்ஸ்<br>Fax | 081-2213082 |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | CPC/PSC/15-18/TO/EB – 2019 II (2026) | ඔබේ අංකය<br>உமது இல<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2026.03.19 |

මධ්‍යම පළාතේ ප්‍රධාන ලේකම්,
ආණ්ඩුකාර ලේකම්,
සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
සියලුම ආයතන ප්‍රධානීන්.

**ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III සහ II ශ්‍රේණියේ නිලධරයන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාග - 2019 III (2026)**

රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් විසින් අංක 2,480 හා 2026.03.13 දිනැතිව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළකරන ලද නිවේදනය මගින් ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III හා II ශ්‍රේණියේ නිලධරයන්ගේ කාර්යක්ෂමතා කඩඉම් පැවැත්වීමට අදාලව අයදුම්පත් කැඳවා ඇත.

02. එම ගැසට් පත්‍රයේ සඳහන් පරිදි සුදුසුකම් සපුරා ඇති මධ්‍යම පළාත් තාක්‍ෂණ සේවයේ III ශ්‍රේණියේ සහ II ශ්‍රේණියේ නිලධාරීන්, එම ගැසට් නිවේදනය ප්‍රකාරව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ "our Services" යටතේ ඇති " Online Applications – Recruitment Exam / E.B. Exams" ඔස්සේ පළකර ඇති අයැදුම්පත්‍රය මාර්ගගතව (Online) යොමු කළ යුතුය. [අයැදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ග ගත ක්‍රමයට (online) පමණි.]

03. **මාර්ගගත අයදුම්පත් භාර ගැනීම:** 2026 මාර්තු මස 16 දින පෙ.ව. 09.00 ට විවෘත වන අතර 2026 අප්‍රේල් මස 10 දින ප.ව. 09.00 ට අවසන් වේ.

04. අයදුම්පත මාර්ගගතව යොමු කළ පසු එය බාගත කර මුද්‍රිත පිටපතෙහි අදාළ කොටස් අත් අකුරින් පුරවා අයදුම්කරුගේ අත්සන සහතික කර, අදාළ ආයතන ප්‍රධානියාගේ සහතිකය සමඟ අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ ඊට පෙර විභාග කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කළහැකි වන පරිදි "**ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 244, කටුගස්තොට පාර, මහනුවර**" යන ලිපිනය වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත බහා එවන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් කළ යුතු ය.

05. අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳ දරාගත යුතු ය.

(අ.පි.බ)

06. පළමු වරට මෙම විභාගයට අයදුම්කරන නිලධරයන් විසින් කිසිදු විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එසේ වුවත් ඉන්පසු වාර වලදී නිලධරයන් විභාගයට පෙනී සිටින්නේ නම් එක් විෂයක් සඳහා විභාග ගාස්තුව රු. 250.00 කි. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතුය.

- ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card)
- අන්තර්ජාල ගෙවීම් පහසුකම සහිත ඕනෑම බැංකු හර කාඩ් පතක් මගින් (Any Bank Debit Card With the Facility of Internet Transactions)
- ලංකා බැංකු ඔන්ලයින් බැංකු ක්‍රමය / Flex යෙදවුම මගින් (Online Banking Method of Bank of Ceylon)
- ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Any Branch of Bank of Ceylon)

සටහන :-
(අ) ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

07. **අදාළ ගැසට් පත්‍රයේ විධිවිධාන අනුව** කටයුතු කිරීම සඳහා අදාළ ආයතන ප්‍රධානීන් මගින් මධ්‍යම පළාත් තාක්ෂණ සේවයේ නිලධාරීන් දැනුවත් කරන ලෙසත් එම නිලධාරීන්ගේ අයදුම්පත්‍ර සහතික කිරීමේදී තොරතුරු නිවැරදිදැයි පරීක්ෂාකර අයදුම්පත්‍ර සහතික කර එවන ලෙසත් වැඩිදුරටත් සඳහන් කරමි.

කේ.කේ.ජී.අයි.ඩී.පී. විජේතිලක,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
මධ්‍යම පළාත.